**ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල ව්‍යාපෘතියේ මැලේරියාව 8 වන වටය සංරචකය (ජීඑෆ්ඒටීඑම්) -2013**

-----------------------------------------------------------------------------------------------------

ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල් ව්‍යාපෘතියේ මැලේරියාව 8 වන වටය සංරචකයේ (ජීඑෆ්ඒටීඑම්) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) සහ ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල (ජීඑෆ්ඒටීඑම්) අතර 2009 සැප්තැම්බර් 17 දින එළඹි අංක එස්ආර්එල්-809-ජී10-එම් දරන ප්‍රදාන ගිවිසුමේ 13(ආ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති

------------------------------------------------------------------------

ප්‍රදාන ගිවිසුමට අනුව, සෞඛ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘති විෂයපථය හා කාර්යයන්, අයවැය ලේඛන, වැදගත් සිදුවීම් සහ දර්ශක ඇතුළු ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. වර්තමානයේ ශ්‍රී ලංකාවේ බහුල වශයෙන් මැලේරියාවෙන් පීඩාවට පත් ගැටුම්වල බලපෑමට ලක්වූ දිස්ත්‍රික්කවල මායිම් ජනතාව අතර කඩිනමින් මැලේරියාව පාලනය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. කඩිනම් මැලේරියා පාලන ව්‍යාපෘතියේ 8 වනි වටය සඳහා ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො. 13,059,866 ක් වන අතර, සම්පූර්ණ මුදලම මූල්‍යායනය කිරීමට ඒඩ්ස්, ක්ෂය රෝගය සහ මැලේරියාව මර්දනය කිරීම සඳහා වූ ගෝලීය අරමුදල එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2009 සැප්තැම්බර් 01 දින ආරම්භ කරන ලද අතර, 2014 අගෝස්තු 31 වන විට නිමකිරීමට අපේක්ෂිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම හා යොදා ගැනීමත් අවස්ථාවෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

----------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම සහ විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලබන පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියෙහි මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම්, ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන විස්තරාත්මක මූල්‍ය වාර්තා සහ ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ අරමුදල් සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ප්‍රදානයෙන් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ප්‍රදාන යටතේ ආපසු ගැනීම් ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදාන යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) පෙර වර්ෂයේ මාගේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණේද යන බව.

(එ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණේද යන බව.

**3.** **මතය**

**-------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දුන් කරුණු නිවැරදි කිරීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඈ) ප්‍රදාන ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලව කටයුතු කර තිබුණු බවත්ය.

**4.** **මූල්‍ය ප්‍රකාශන**

**4.1** **මූල්‍ය කාර්යසාධනය**

මූල්‍ය ප්‍රකාශන සහ ලබාගත හැකිවූ තොරතුරු අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.225,262,893 (එජඩො 1,734,716) ක් වූ අතර, 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.1,142,769,557 ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම, ඉකුත් වර්ෂයේ වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයට වියදම | | | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|---|---|
| | 2013 | | 2012 | | |
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. | රු. |
| දේපල පිරියත සහ උපකරණ | 794,548 | 103,887,202 | 204,637 | 26,021,667 | 189,083,412 |
| මැලේරියා පාලන කටයුතු | 940,168 | 121,375,691 | 1,331,184 | 169,859,089 | 953,686,145 |
| | 1,734,716 | 225,262,893 | 1,535,821 | 195,880,756 | 1,142,769,557 |

## 4.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2012 සහ 2013 වර්ෂ සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි තත්ත්වය පහත දැක්වේ.

| | 2013 දෙසැම්බර් 31 දිනට | | 2012 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. | එ.ජ.ඩො. | රු. |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| විදේශාධාර ප්‍රදානවලින් (වැය සම්මතය - 13) සහ විදේශාධාර ආශ්‍රිත දේශීය අරමුදල්වලින් (වැය සම්මතය - 17) ලැබුණු මුදල් | 1,642,138 | 212,000,000 | 1,449,843 | 185,000,000 |
| ලංසු ආදායමෙන් ලද මුදල් | - | - | 110 | 14,000 |
| වැඩසටහන් වියදම් සඳහා ගෙවූ මුදල් | (940,168) | (121,375,691) | (1,331,184) | (169,859,089) |
| ගෙවූ අත්තිකාරම් (ශුද්ධ) | 118,936 | 15,551,033 | 324,061 | 41,207,573 |
| ගෙවිය යුතු මුදල්වල වැඩිවීම (රඳවාගත් බදු සහ රඳවා ගැනීම් මුදල්) | (8,291) | (1,108,174) | (947) | (80,403) |
| විදේශ විනිමය (පාඩුව) / ලාභය | (8,859) | - | 411 | - |
| මෙහෙයුම් කටයුතුවලින් ශුද්ධ මුදල් | 803,756 | 105,067,168 | 442,294 | 56,282,981 |
| **ආයෝජන කටයුතුවලින් මුදල් ප්‍රවාහය** | | | | |
| ස්ථාවර වත්කම් | (794,548) | (103,887,202) | (204,637) | (26,021,668) |
| ආපසු ගෙවිය යුතු ලංසු තැන්පතු | - | (24,000) | - | - |
| ආපසු ගෙවිය යුතු තැන්පතු (Locker) | - | - | - | (40,000) |
| ආයෝජන කටයුතුවල යෙදූ ශුද්ධ මුදල් | (794,548) | (103,863,202) | (204,637) | (26,061,668) |
| මූල්‍ය කටයුතුවලින් මුදල් ප්‍රවාහය (භාණ්ඩාගාරයට ආපසු යැවීම) | (9,208) | (1,203,966) | (237,657) | (30,220,413) |
| | (803,756) | (105,067,168) | (442,294) | (56,282,081) |

## 5. විගණන නිරීක්ෂණ

## 5.1 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) මුදල් රෙගුලාසි | |
| (i) මුදල් රෙගුලාසි 135 සහ 2013 ජනවාරි 21 දිනැති අංක එස්එෆ්/01/2013 දරන සෞඛ්‍ය අමාත්‍යාංශ චක්‍රලේඛය | ව්‍යාපෘති අධ්‍යක්ෂකට ගෙවීම් අනුමත කිරීම රු.2,000,000 කට සීමාකර තිබුණි. ඊට පටහැනිව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් එකතුව රු.91,739,966 කට අදාළ ගනුදෙනු 7 ක් සඳහා නියමිත සීමාව ඉක්මවා අනුමැතිය ලබාදී තිබුණි. කෙසේ වෙතත් 2014 ඔක්තෝබර් මාසයේදී සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම් විසින් ආවරණ අනුමැතිය ලබාදී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි371(2)(ඇ) | අත්තිකාරම් මුදලක් ලබාගත් පසු එයට අනුමත කාර්යය නිමවූ වහාම පියවිය යුතු නමුත්, අවස්ථා 20 කදී ලබාදුන් එකතුව රු.957,650 ක් වූ අත්තිකාරම් මාස 4 සිට මාස 6 දක්වා වූ කාල පරාසයක ප්‍රමාදයකින් පසුව පියවා තිබූ බව නිරීක්ෂණය විය. |
| (iii) මුදල් රෙගුලාසි 756 | රු.189,083,412 ක් වටිනා ස්ථාවර වත්කම් භෞතික සත්‍යාපනයකට භාජනය කර නොතිබුණි. |
| (ආ) අංක 2002 නොවැම්බර් 28 දිනැති අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | මැලේරියා පාලන කටයුතු සඳහා ව්‍යාපෘතිය විසින් මිලදීගත් පරිගණක හා අදාළ මෘදුකාංග වෙනුවෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 5.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකට අනුයුක්ත කර තිබූ මෝටර් රථයක් අළුත්වැඩියා කිරීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.806,406 ක් වැය කර තිබුණි. කෙසේ වෙතත් අදාළ මෝටර් රථය මැලේරියා මර්දන ව්‍යාපාරයට අයත් බවට තහවුරු කර ගැනීමට ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 6. මූල්‍ය සහ භෞතික කාර්යසාධනය

## 6.1 අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදන, සමාලෝචිත වර්ෂය තුළ සහ 2013 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුමෙන් මූල්‍යයනය කිරීමට එකඟවූ මුදල | | 2013 වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය | වර්ෂය තුළ ලද අරමුදල් | | 2013 වර්ෂය තුළදී උපයෝජනය කළ අරමුදල් | | 2013 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කළ අරමුදල් | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන |
| ජීඑෆ්ඒටීඑම් | 13.059 | 1,498 | 254.56 | 1.285 | 166.0 | 1.272 | 165.34 | 9.190 | 1,203 |
| ශ්‍රී.ලං.ර. | - | - | - | - | 46.0 | - | - | - | - |
| | 13.059 | 1,498 | 254.56 | 1.285 | 212.0 | 1.272 | 165.34 | 9.190 | 1,203 |

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.මිලියන 204 කට සමාන එ.ජ.ඩො. මිලියන 1.568 ක මුදලක් මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු නමුත් රු.මිලියන 166 ක් පමණක් ව්‍යාපෘතියට මුදාහැර තිබුණු අතර, එයින් රු. මිලියන 165.34 ක් පමණක් ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි.

(ආ) විස්තරාත්මක සැලැස්මට අනුව, 2009 සැප්තැම්බර් 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා එ.ජ.ඩො. මිලියන 11.626 ක් මුදාහැරීමට ගෝලීය අරමුදල අපේක්ෂා කර තිබුණද, එ.ජ.ඩො. මිලියන 9.914 ක් ව්‍යාපෘතියට මුදාහැර තිබුණි. එයින් එ.ජ.ඩො. මිලියන 9.190 ක් පමණක් 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් උපයෝජනය කර තිබුණි. ශේෂය වූ එ.ජ.ඩො. 627,271 ක මුදල මහා භාණ්ඩාගාරය විසින් රඳවාගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 85 ක් ඉක්මවූ පසු අනුමත ප්‍රදානයෙන් සියයට 70 කට සමාන එ.ජ.ඩො. මිලියන 9.190 ක් පමණක් උපයෝජනය කර තිබූ බව නිරීක්ෂණය විය. ඒ අනුව, ඉතිරි මාස 9 ක් වූ ව්‍යාපෘති කාලය තුළ ප්‍රදානයෙන් ඉතිරි වූ එ.ජ.ඩො. මිලියන 3.89 ක මුදල උපයෝජනය කළ හැකිවේද යන්න සැක සහිතය.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ගෝලීය අරමුදල විසින් වෙන් කරන ලද රු.204,100,000 (එ.ජ.ඩො.1,568,393) ක මුදලින් රු.166,000,000 ක් ව්‍යාපෘතියට ප්‍රේෂණය කර තිබූ බව නිරීක්ෂණය විය. එයින් රු.39,304,040 ක මුදලක් හෙවත් සියයට 19 ක් ව්‍යාපෘති කටයුතු සඳහා උපයෝජනය කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී කාර්යයන් 18 කට වෙන් කරන ලද එකතුව රු.40,001,520 ක සම්පූර්ණ ප්‍රතිපාදනයම උපයෝජනය කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මඟින් රු.127,712,520 ක් කාර්යයන් 27 ක් සඳහා වෙන් කර තිබූ නමුත් 2013 දෙසැම්බර් 31 දිනට රු.39,338,919 ක් හෙවත් සියයට 31 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(උ) තවද, අදාළ බලධාරීන්ගේ විධිමත් අනුමැතිය නොමැතිව කාර්යයන් 5 ක් සඳහා අයවැයෙන් වෙන් කර තිබූ මුදල ඉක්මවා රු.3,355,778 ක් වැය කර තිබුණි.

(ඍ) ඊට අමතරව, ව්‍යාපෘතියේ වාර්ෂික අයවැය ලේඛනයෙහි ඇතුළත් නොවූ කාර්යයන් 9 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී රු.40,886,254 ක මුදලක් වැය කර තිබුණි.

(එ) අදියර 1 හි මැලේරියා 8 වන වටය යටතේ සම්පූර්ණ කළයුතු වූ කාර්යයන් සඳහා ව්‍යාපෘතිය විසින් රු.86,551,950 ක් වැය කර තිබුණි.

**6.3 භෞතික කාර්යසාධනය**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ මැලේරියා සංරචකයෙහි අරමුණ 2014 වර්ෂයේදි මැලේරියාව දේශීයව තුරන් කිරීමයි. කෙසේ වෙතත්, මැලේරියාව බලපෑ රටවල්වලින් ශ්‍රී ලංකාවට පැමිණි අය 95 දෙනෙකු හැර සමාලෝචිත වර්ෂයේදී කිසිඳු දේශීය මැලේරියා තත්ත්වයක් වාර්තා වී නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී, පිරිවැය රු.1,700,000 කට මානව සම්පත් මෘදුකාංග පැකේජයක් ප්‍රසම්පාදනය කිරීම සඳහා ලංසු ප්‍රදානය කර තිබුණි. මෙයින් ලංසු මුදලෙන් සියයට 75 ක් නියෝජනය වන රු.1,275,000 ක මුදලක් 2013 දෙසැම්බර් 31 දින වන විට සැපයුම්කරුට ගෙවා තිබුණි. කෙසේ වෙතත්, යොමුගත කොන්දේසි (TOR) අනුව පහත සඳහන් පහසුකම් සැපයිය යුතුව තිබුණි.

(i) අන්තර්ජාලය හරහා දිස්ත්‍රික් නිලධාරීන්ට පද්ධතියට ප්‍රවේශවීමේ පහසුකම්

(ii) ප්‍රධාන කාර්යාලය විසින් සපයන තොරතුරු දිස්ත්‍රික් නිලධාරීන්ට දර්ශනය වීමේ පහසුකම්

(ඇ) වැඩ සැලැස්ම අනුව, පොලිමර් දාම ප්‍රතික්‍රියා රසායනාගාරයක් (Polymerse Chain Reaction Laboratory) ස්ථාපිත කිරීම 2012 සැප්තැම්බර් 30 දිනට ප්‍රථම කළ යුතු විය. කෙසේ වෙතත් ඒ සඳහා පියවර ගෙන නොතිබුණි. රසායනාගාරය ඉදිකිරීම ප්‍රමාදවීම හේතුකොට ගෙන එහි භාවිතය සඳහා මිලදී ගෙන තිබූ රු.4,872,944 ක් වටිනා උපකරණ නිශ්කාර්යව පැවතුණි. 2013 දෙසැම්බර් 31 දින වන විට එම උපකරණවල වගකීම් සහතික කාලයද ඉකුත්වී තිබුණි.

(ඈ) මැලේරියා මර්දන ව්‍යාපාරය විසින් වයඹ විශ්ව විද්‍යාලය සමඟ එළඹී ගිවිසුමට අනුව, මදුරු පිලව් පාලන කටයුතු 2012 ජූනි වන විට නිම කළ යුතුව තිබුණි. කෙසේ වෙතත්, 2014 අගෝස්තු මාසය වනතුරුත් එම කටයුතු නිම කර නොතිබුණි.

(ඉ) භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය සඳහා ලබාදෙන අත්තිකාරම් පිළිබඳ මූල්‍ය පාලනය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කර නොතිබුණි. අවස්ථා 49 කදී ඇස්තමේන්තු ලබා ගැනීමෙන් තොරව රු.1,609,523 ක් වූ අතිරික්ත අත්තිකාරම් ගෙවා තිබූ බව නිරීක්ෂණය විය.

(ඊ) ව්‍යාපෘතියේ මූල්‍ය පාලනය ශක්තිමත් කිරීමේ අරමුණින් ව්‍යාපෘතියේ ගනුදෙනු අභ්‍යන්තර විගණනයකට භාජනය කර නොතිබුණි.

**7.** **පද්ධති හා පාලන**

**--------------------**

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

(අ) අයවැය පාලනය

(ආ) භාණ්ඩ ප්‍රසම්පාදනය

(ඇ) ඉන්වෙන්ට්‍රි පවත්වාගෙන යාම

(ඈ) අග්‍රිම සහ අත්තිකාරම් පියවීම

(ඉ) ගිණුම්කරණය

(ඊ) අරමුදල් කළමනාකරණය